ලොව පුරා පැතිර යන කොවිඩ්-19 වසංගතයට මූලය වන සාර්ස්-කොව්-2 වෛරසය ජාන වෙනස් වෙමින් නව ප්‍රභේද බිහි කරන අතර, එම නව වෛරස ප්‍රභේද විවිධ රටවලින් සහ විවිධ ප්‍රදේශයන්ගෙන් හමුවේ. එහිදී "ඉන්දීය කෝවිඩ් ප්‍රභේදය", "බ්‍රිතාන්‍ය වෛරසය", "ඉන්දීය කොරෝනාව" වැනි ආකාරයන්ගෙන් එම රටවල් හෝ ප්‍රදේශයන්ගේ නමින් එම වෛරස ප්‍රභේදයන් හඳුන්වන නැඹුරුතාවක් මෙතෙක් මාධ්‍ය තුළ දක්නට ලැබිණි. කෙසේ නමුත්, මෙසේ යම් යම් රටවල නමින් වෛරස ප්‍රභේදයක් හැඳින්වීම, එම රටවල් සහ ජාතිකයින් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් ඇතිවීමටත්, එම රටවල් පිළිබඳව විදේශ භීතිකාවක් (Xenophobia) පවා ඇතිවීමටත් හේතු විය හැකි බව නොසලකා හැරිය හැකි නොවේ.
මේ අතර මෑතකදී මෙම කොරෝනා වෛරස ප්‍රභේදයන් සඳහා ග්‍රීක් හෝඩියේ අකුරු භාවිතා කරමින් නව නාමකරණයක් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් හඳුන්වා දෙයි. රටවල් වල නම් ඔස්සේ නව වෛරස ප්‍රභේදයන් නොහඳුන්වන ලෙසටත්, නව නාමකරණය අනුව වෛරස ප්‍රභේදයන් හඳුන්වන ලෙසටත් ඒ අනුව නිර්දේශ කෙරේ.
පහත දැක්වෙන්නේ ජූනි 18 දින සිංහල පුවත්පත් කිහිපයක සිරස්තල කිහිපයකි. එහිදී තවමත් ඒ ඒ වෛරස ප්‍රභේදයන් මුලින් වාර්තා වූ රටවල නම් ඔස්සේ හඳුන්වන ප්‍රවණතාව අඩුවී නොමැති බව දැකිය හැක. එය කෙතරම් ආචාර ධර්මානුකූලදැයි අපට විමසීමට සිදුවේ. කෙසේ නමුත්, ඒ අතර පුවත්පත් කිහිපයක සිරස්තල තුළ නිවැරදි ආකාරයෙන් නව නාමකරණය අනුව එම වෛරස ප්‍රභේදය හඳුන්වා දී තිබේ. මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල වාර්තාකරණය නම් එයයි. ඒ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?
එසේම, පසුගිය සිකුරාදා (06/18) දිනයෙන් පසු, ඇතැම් පුවත්පත් තුළ රටවල් වල නම් ඔස්සේ කොරෝනා වෛරස ප්‍රභේදයන් හඳුන්වන ප්‍රවණතාවයේ යම් අඩුවක් නිරීක්ෂණය කළ හැකි වී තිබුණි.
මූලාශ්‍ර:
https://www.youtube.com/watch?v=8BRbVG5-47Y&t=1211s
https://www.nature.com/articles/d41586-021-01483-0
#MediaEthicsSL #lka #SinhalaNews #Lankadeepa #Dinamina #Ada #Aruna #Divaina #Mawbima